**නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 17 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශයේ පිහිටි කොට්ඨාශ 21ක පවතින දේපළ 22,494ක් මත හිඟ වරිපනම් බදු රු.12,837,893ක් වශයෙන් ගිණුම්වල ඉදිරිපත් කර තිබුණත්, ලෙජර් ගිණුම්වල රු. 16,444,270ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව ගිණුම්වල රු. 3,606,377ක් අඩුවෙන් දක්වා තිබුණි. | ලේඛනගත කිරීම නිසි අයුරින් සිදුවීම තහවුරු කිරීමට කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ සභා බල ප්‍රදේශයේ පිහිටි කොට්ඨාශ 21ක පවතින දේපළ 22,494ක් මත හිඟ වරිපනම් බදු රු.3,606,377ක් අඩුවෙන් දක්වා තිබුණි. ඉදිරියේදී අමාත්‍යාශයේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කරනු ලැබේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මැයි සිට ඔක්තෝබර් මාසය දක්වා කාලයට අදාල උසාවි දඩ රු.6,411,650ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු වට්නාකම්ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 මැයි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා රු.6,411,650ක් උසාවි දඩ ගාස්තුව අප ආදායම් පරීක්ෂක වරයා විසින් ගණනය කරන ලද්දකි. මේ දක්වා කාලයක් අවසන් ගිණුම්වල නීත්‍යානුකූල ලිපි මගින් ලැබු ආදායම් පමණක් අන්තර්ගත කර ඇත. |
| (ඇ) | 2018 වර්ෂයට අදාල මුද්දර ගාස්තු රු.14,939,320ක් සහ සමාලෝචිත | ලැබිය යුතු ශේෂ ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කළ | මෙම වට්නාකම ගණනය කිරීමේ වකවානුවේදි තහවුරු |

| | | |
|---|---|---|
| වර්ෂ අවසානය දක්වා වූ හිඟ මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | යුතුවේ. | කරනු ලැබූ නමුත් නොලැබූ නිසා ගිණුම්වලින් ලැබූ ආදායම් පමණක් ඇතුළත් කරන ලදි. |
| (ඈ) පුද්ගලික ඉඩම් කට්ටි කිරීමේදි පොදු කටයුතු වෙනුවෙන් සභාවට වෙන්කරනු ලැබූ සියයට 10ක් වූ අක්කර 03 රූඩ් 01 පර්චස් 14.29ක වපසරියකින් යුත් ඉඩම්වල වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වත්කම්වල වටිනාකම ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ගිණුම්වල මෙය අන්තර්ගත කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) 2017 සහ 2018 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසියේ විකිණීමට නිර්දේශ කළ 2017 වර්ෂයට අදාල භාණ්ඩ 376ක් සහ 2018 වර්ෂයට අදාල භාණ්ඩ 130ක් වෙන්දේසි මගින් විකුණා රු.145,836ක් ලැබී ඇති අතර මෙම වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර නොතිබුණි. | ඉවත් කළ වත්කම්වල වටිනාකම අඩුකර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි වෙන්දේසියේ විකිණීමේදි එම වත්කම්වල පිරිවැය ගණනය කර ගිණුම්වල අඩුකර දැක්විමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) ආරක්ෂක සේවාව, විදුලිය සම්බන්ධතා, වාහන අමතර කොටස් මිලදී ගැනීම සහ සම්බන්ධිත වියදම් රු.8,809,722ක් මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමට ඇතුළත් කර තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ වියදම් පමණක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුම යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | අප සභාවේ ගිණුම් වාර්තා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව Standard Format හි අවසන් ගිණුම් පිළියෙල කර තිබුණි. මෙමනිසා විවිධ සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වැය කළ රු.8,809,722 ක් ද මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමටම ඇතුළත් කර තිබේ. |

### 1.3.2 ලැබිය යුතු ගිණුම්

| ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙළෙඳ පොල කුලී රු.1,188,570ක් අඛණ්ඩව වර්ෂ 05කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර තිබූ නමුත් හිඟ මුදල් අයකිරීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතු වේ. | දීර්ඝ කාලයක සිට පවතින බදු කුලී 2015 වර්ෂයට පෙර පැවැති රු.455,232ක් වේ. මෙම හිඟ හිටි වටිනාකමට අදාල සාක්ෂි කිසිවක් ලේඛනවල දක්නට නොවිය. එසේම 2016, 2017 වර්ෂවල බදු ලබාදුන් බදුගත් අයගෙන් ලැබූ මුදල් රු. 165,336න් ආදායමට ඇතුළත් නොකර තැන්පත්වල දක්වා තිබුණි. |

**1.3.3 විගණනය සඳහාලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.149,885,647 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා හිමිකම් ඔප්පු ස්ථාවර වත්කම් ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයේ අප සභාවට අයත් හිමිකම් සහිත ඉඩම් සහ ගොඩනැගිලි පමණක් ඇතුළත් කර ඇත. අනෙකුත් ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රාදේශීය සභාවට භාරදීම් පිළිබඳව ඉඩම් හිමිකම් තහවුරු කිරීමේ ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යවා තිබූ නමුත්, මෙම ඉඩම් සහ ගොඩනැගිලිවල හිමිකම් ඔප්පු ලැබී නොතිබුණි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය | 1990 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ විවිධ පාර්ශවයන්ට ලබාදුන් අත්තිකාරම් රු.2,356,250ක් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව ගිණුම්වලින් කපා හැර තිබුණි. | වගකිව යුතු අයගෙන් අනුමැතිය ලබා කපා හැරිමට කටයුතු කළ යුතුවේ. | අප සභාව විසින් පසුගිය කාලයේ ලබාදුන් රු.2,356,250ක් ගිණුම්වල ඉදිරිපත් නොකර කපා හැර තිබුණි. මේ සඳහා අමාත්‍යාංශයේ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,222,592 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 47,913,097 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම්හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 26,225 | 39,130 | 26,292 | 12,838 | 26,420 | 24,323 | 23,502 | 821 |
| කුලී | 3,238 | - | 2,512 | - | 2,786 | 2,362 | 2,263 | 99 |
| බලපත්‍ර ගාස්තු | 6,318 | - | 1,286 | - | 4,523 | 2,510 | 2,415 | 95 |
| | 35,781 | 39,130 | 30,090 | 12,838 | 33,729 | 29,195 | 28,180 | 1,015 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවම වශයෙන් වර්ෂ පහකට වතාවක් දේපළ තක්සේරු කර වරිපනම් බදු අය නොකර 2012 වර්ෂයේ තක්සේරුව පදනම් කර ගනිමින් මේ දක්වා බදු අයකර තිබුණි. තවද, වාර්ෂික වටිනාකමින් අයකරන ප්‍රතිශතයද සියළුම ආකාරයේ දේපළ සඳහා සියයට 6ක ප්‍රතිශතයක් පමණක් අයකරමින් පැවතුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී අදාල කටයුතු සිද කළ යුතුවේ. | සභාව විසින් අයකරන වරිපනම් බදු 2012 වර්ෂයේ බදු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබුණි. 2019 වර්ෂය සඳහා නැවත තක්සේරු කර දෙන ලෙසට ඉල්ලීම් කර බදු තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපි යවා ඇත. |

### 2.2.3 දුරකථන සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීමේ ඉඩම් බදු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුද්ගලික ආයතන තුනකට දුරකථන සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීමේ ඉඩම් ලබාදීමේ කුලී වටිනාකම් තක්සේරු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ලබාගෙන ගිවිසුම්වලට එළැඹිය යුතුවේ. | ප්‍රාදේශීය සභාවට අයත් මෙම දේපළ කුලියට ලබාදී ඇති කඩකාමර සංකීර්ණයටත්, දුරකථන සන්නිවේදන කුළුණු සඳහාත් වරිපනම් බදු තක්සේරු කර තිබුණත් නියමිත කුලි පිළිබඳව එවකට නිලධාරීන් විසින් තක්සේරු දෙපාර්තමේන්තුවේ කුලි තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. දුරකථන සන්නිවේදන |

| | | | |
|---|---|---|---|
| | | | ආයතනය සමග ගිවිසුම් අළුත් කිරීමේදි තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තා ලබා ගැනීමෙන් කුලී අයකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | දුරකථන සමාගමක් සමඟ එළැඹ තිබූ ගිවිසුම්වලට පරිබාහිරව කළ අයකිරීම් නිසා රු.18,152ක් අඩුවෙන් අයකර තිබුණි. | ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් අනුව 2015.09.01 දින සිට 2019.08.31 දින දක්වා කාලපරිච්ඡේදයේ මාසික කුලී ලෙස රු.14,641ක් ලෙස ගිවිසුම්ගත වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංක SEC/2018/05 දරන 2018.03.29 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව Payments to which section 84 (1) (a) (i) අනුව 10% ක රඳවා ගැනීමේ බදු අඩුකිරීමක් ලබාදිමට අනුව එම ආයතනයෙන් රු.13,176.90ක් ගෙවා තිබුණි. |

**2.2.4 ඉඩම් විකුණුම් මත බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 හා 2018 වර්ෂවල ඉඩම් විකුණුම් මත අයකළ යුතු සියයට 1ක බදු ලෙස පිළිවෙලින් රු.3,095,970ක් සහ රු.2,899,430ක් අයකරගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව පියවර ගත යුතුවේ. | 1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, අප සභා බල ප්‍රදේශයේ වෙන්දේසියේ විකිණීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ වෙන්දේසි විකුණුම්කරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා මගින් ඉඩමක් විකුණනු ලබන එමගින් ලැබෙන 1%ක බද්ද අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.5 සංචාරක නිකේතනවල ආදායම් මත ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ ලියාපදිංචි කළ නිවාඩු නිකේතනයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පලක් ආදියෙන් ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාරව, අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර ගාස්තු සියයට 1 දක්වා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාරව, අතුරු ව්‍යවස්ථා සකස් කළ නමුත් අනුමත නොකළ හේතුව නිසා මෙම බදු අයකළ නොහැකිව පැවතුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයුර්වේද මධ්‍යස්ථානයේ ඇපොතිකරි දෙදෙනෙකුගේ (02) පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පුරප්පාඩු පිරවීම් සඳහා අනුමැතිය මේ දක්වා ලැබී නොතිබුණි. |

**33.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.3.1 වීථි ලාම්පු සවි කිරීම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මාර්ගවලට වීථි ලාම්පු සවිකිරීම සඳහා LED Street Lamp (150W) ගුණත්වයෙන් යුත් විදුලි බල්බ 85ක් රු.1,105,500කට මිලදී ගෙන තිබුණි. නමුත් විදුලි බල්බවල මිල රු.2,000 සිට රු.10,000 දක්වා මිල උච්චාවචනය වී තිබුණි. | ගුණත්වයෙන් ඉහළ විදුලි බල්බ අවම පිරිවැයකට මිලදී ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ලැබු ලංසු සහ මිලදී ගැනීමේ තීරණ (2019.01.14 සහ 2020.08.05) අනුව අළුත්වැඩියාවට යටත්වන වගකීමක් සහිත Copra LED 150ක් සඳහා ඉතාමත් අඩු මිල රු.12,880 ක් ලෙසත් රු. 11,150 ක් ලෙසත් පැවතුණි. තවද, මෙය 2020 වර්ෂයේ මිලදී ගැනීමේදි ඒකකයක Copra LED ඉතාමත් අඩුම මිල රු.10,400 ක් වශයෙනුත් විය. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 ස්ථාවර වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 01A 07R 7.29P වපසරියකින් යුත් ඉඩම් සභාව විසින් කිසිදු ආකාරයක උපයෝජන කටයුත්තක් සඳහා භාවිතා | ඉඩම් සුදුසු සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අප සභාවට ලැබෙන අරමුදල් භාවිතයෙන් මෙම ඉඩම්වල සැලසුම් ක්‍රියාකාරකම් සිදු කිරීමට අරමුදල් ප්‍රමාණවත් නොවේ. එනමුත්, |

| | | |
|---|---|---|
| නොකර වර්ෂ 03 කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | | වර්තමානයේ හිමිකම් ඔප්පු අංක3785 දරන ඉඩම අප සභාවේ වාහන අළුත්වැඩියා කිරීමේ වැඩපළ සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ වාහන නැවතුම්පළ ඉදිකිරීම සඳහාත් භාවිතා කිරීමට සුදුසු අයුරින් ආසියානු සංවර්ධන බැංකුවේ දායකත්වය සහිතව සිදුකිරීමට යෝජිතය. ඉදිරියේදි මෙම ඉඩම් උපයෝජනය සඳහා කටයුතු කරනු ලැබේ. |

**3.4.2** **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2018 වර්ෂයේ ආරම්භක ශේෂ නොසලකා සිදු කර තිබුණි. | පසුගිය වර්ෂය සමග සසඳා වාර්ෂික භාණ්ඩ තොගය තහවුරු කිරිමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදි තොග ලේඛනය පරික්ෂා කිරිමෙන් පසුව සමීක්ෂණ කටයුතු කර ඇති බව දන්වා සිටිමි. ඉදිරියේදි පසුගිය වර්ෂයේ තොග සමීක්ෂණ ලේඛනගත කිරීම් සුපරීක්ෂාවට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් 2018 සහ 2019 වර්ෂවල සිදු කරන ලද නිර්දේශවලට අනුව කටයුතු කළ යුතු වුවත් ,අදාල භාණ්ඩවල වෙන්දේසි විකිණීම් සම්බන්ධයෙන් පමණක් අවධානය යොමුකර තිබූ අතර අනෙකුත් කාරණා පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | වැරදි නිවැරදි කිරිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවන බව දන්වා සිටිමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කල යුතුවේ. | අප සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරි ලෙස S.M. තිරානි මිය කළමනාකාර සහකාර පත්වීම් ලබා සිටි නමුත් සේවක පුරප්පාඩු හේතුවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ පර්යේෂණ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු කරනු ලැබේ. |